# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1788/7 - 2012 දෙසැම්බර් මස 11 වැනි අඟහරුවාදා - 2012.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය සේවක පිරිස් සේවා ව්‍යවස්ථාව

1991.05.17 වැනි දින අංක 662/11 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කරන ලද සහ 1994.05.09 වැනි දින අංක 818/1, 2001.03.23 වැනි දින අංක 1176/15, 2006.10.20 වැනි දින අංක 1467/32, 2007.04.16 වැනි දින අංක 1493/3, සහ 2009.11.30 වැනි දින අංක 1630/10 යන *ගැසට් පත්‍ර* මගින් සංශෝධිත ඉහත සඳහන් සේවා ව්‍යවස්ථාව තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

2001.03.22 වැනි දින අංක 1176/15 දරන *ගැසට් පත්‍රයේ* සඳහන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත සහ අමාත්‍ය මණ්ඩලයේ නියෝගය මත ප්‍රකාශයට පත්කරන ලද 6.1.3.9(1) වගන්තියට පහත සඳහන් සංශෝධනයන් ඇතුළත් කරනු ලැබේ.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2012 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ 10,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ය.

සංශෝධනය

6.1.3.9(1) වගන්තිය - අවසාන සේවා ස්ථාන

ශික්ෂණ රෝහල - අනුරාධපුරය, ශික්ෂණ රෝහල - මඩකලපුව යන ආයතන ද අවසන් සේවා ස්ථාන ලෙස සැලකේ.

වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ අනෙකුත් ව්‍යවස්ථා ඒ අයුරින්ම ක්‍රියාත්මක වන අතර පෙර සේම වලංගුව පවතිනු ඇත.

12-718

1A - G 16990— 340 (2012/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.